# කැලිෆෝනියානු නීතිය ඔබව ද්වේෂ ප්රචණ්ඩත්වයෙන් ආරක්ෂා කරයි

Civil Rights Department
STATE OF CALIFORNIA

## තත්ත්ව පත්‍රිකාව

කැලිෆෝනියානු නීතිය ජාතිය, ජනවර්ගත්වය, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ භාවයේ අනන්‍යතාවය හෝ ආගම වැනි පෞද්ගලික ලක්ෂණ මත පදනම්ව පුද්ගලයෙකුට හෝ ඔවුන්ගේ දේපළවලට එරෙහිව වන ප්‍රණ්ඩකාරී ක්‍රියා හෝ ප්රචණ්ඩත්වයේ තර්ජන තහනම් කරයි. කැලිෆෝනියානු සිවිල් අයිතිවාසිකම් දෙපාර්තමේන්තුව (CRD) එවැනි "ද්වේෂ ප්‍රචණ්ඩත්වය" තහනම් කරන සිවිල් නීතිවලින් එක් නීතියක් බලාත්මක කරයි  - Ralph Civil Rights Act (සිවිල් සංග්රහයේ 51.7 වන වගන්තිය). ඔබ වෛරී ප්‍රචණ්ඩත්වයේ ගොදුරක් වී ඇත්නම්, ඔබට හානි කළ පුද්ගලයාට එරෙහිව CRD වෙත පැමිණිල්ලක් ගොනු කළ හැකිය.

## Ralph Act යටතේ ආරක්ෂා කර ඇති පෞද්ගලික ලක්ෂණ මොනවාද?

පුද්ගලයෙකුගේ සැබෑ හෝ හඳුනාගත්:

- ලිංගභේදය/ස්ත්‍රී පුරුෂ භාවය(ගැබ්ගැනීම්, දරු ප්‍රසූතිය, සහ අදාළ වෛද්‍ය තත්වයන් ඇතුළුව)
- ස්ත්‍රී පුරුෂ භාවයේ අනන්‍යතාවය සහ ස්ත්‍රී පුරුෂ භාව ප්‍රකාශනය
- ජාතිය
- වර්ණය
- ආගම
- පෙළපත
- මුල් ජාතිය
- ආබාධිකත්වය
- වෛද්‍ය තත්වය
- ජානමය තොරතුරු
- විවාහක අවිවාහක බව
- ලිංගික දිශානතිය
- පුරවැසි භාවය
- මූලික භාෂාව
- ආගමන තත්ත්වය
- දේශපාලන අනුබැදිය
- කම්කරු ආරවුලක තනතුර

මෙම ලැයිස්තුගත ලක්ෂණ ආරක්ෂිත ලක්ෂණ සඳහා උදාහරණ වේ; වෙනත් ලක්ෂණ මත පදනම්වද වෙනස් කොට සැලකීමට එරෙහිව නීතිය මිනිසුන් ආරක්ෂා කරයි.

## රැල්ෆ් පනත යටතේ තහනම් කර ඇත්තේ කුමක්ද?

වෛරී ප්‍රචණ්ඩත්වය රැකියා ස්ථානයේ, නිවසේ, පූජනීය ස්ථානයක හෝ වීදියේ ඇතුළු සෑම ස්ථානයකම තහනම් කර ඇත. Ralph Act යටතේ, කැලිෆෝනියානු සිවිල් නීතිය වෛරී ප්‍රචණ්ඩත්වය සහ ප්‍රචණ්ඩත්වයේ තර්ජන මඟින් බිය ගැන්වීම තහනම් කරයි. වෛරී ප්‍රචණ්ඩත්වය යනු පුද්ගලයෙකුගේ සැබෑ හෝ හඳුනාගත් ආරක්ෂිත ලක්ෂණයට එරෙහිව පක්ෂග්‍රාහීව පොළඹවනු ලබන ඕනෑම ප්‍රචණ්ඩ ක්රියාවකි - එනම්, යමෙකු ඔබ පිළිබඳව දන්නා හෝ ඔවුන් ඔබ පිළිබඳව දන්නවා යැයි සිතන දෙය එම පනත යටතේ ආරක්ෂා කර ඇත. එයට සාමාන්‍යයෙන් පුද්ගලයෙකු හෝ ඔහුගේ දේපළ සමඟ ශාරීරික සම්බන්ධතා හෝ ශාරීරික සම්බන්ධතාහි තර්ජනයක් අවශ්‍ය වේ. පනතේ ආරක්ෂණ –  අත්හැරීමට – හෝ යටත් වීමට කිසිවෙකුට පුද්ගලයකුගෙන් ඉල්ලා සිටිය නොහැක. උදාහරණයක් වශයෙන්, පුද්ගලයෙකුට භාණ්ඩ හෝ සේවා ලබා ගැනීමට හැකිවීමට පෙර පනත යටතේ ආරක්ෂණයන්ට යටත් වීමට ඉල්ලා සිටිය නොහැකිය.

උදාහරණයක් වශයෙන්, Ralph Act එය නීති විරෝධී කරනුයේ:

- ප්‍රචණ්ඩත්වයේ තර්ජන මඟින් ආගමික ක්‍රියාකාරකම් අධෛර්යමත් කිරීමට – හෝ නැවැත්වීමට උත්සාහ කිරීම;
- එම පුද්ගලයාගේ සැබෑ හෝ හඳුනාගත් ජාතිය, වර්ණය හෝ මුල් ජාතිය හේතුවෙන් පුද්ගලයෙකුගේ දේපළවලට හානි කිරීම;
- ගොඩනැගිල්ල භාවිතා කරන හෝ අයිති පුද්ගලයින්ගේ සැබෑ හෝ හඳුනාගත් ලිංගික දිශානතිය හේතුවෙන් ගොඩනැගිල්ලක් විනාශ කිරීම හෝ පළුදු කිරීම;
- එම පුද්ගලයාගේ සැබෑ හෝ හඳුනාගත් ත්‍රී පුරුෂ භාවය හෝ ත්‍රී පුරුෂ භාවයේ අනන්‍යතාවය හේතුවෙන් යමෙකුට තර්ජනය කිරීමට හෝ රිදවීමට ආයුධයක් භාවිතා කිරීම හෝ ලෙළවීම (පෙන්වීම);
- සැබෑ හෝ හඳුනාගත් ආබාධිකත්වය හේතුවෙන් පුද්ගලයෙකුට පහර දීම හෝ පහර දීමට උත්සාහ කිරීම; හෝ
- වහා සිදුවීමට යන නීති විරෝධී ක්‍රියාවකට පෙළඹවීම සඳහා - එනම්, නීතිය කඩ කරන ආකාරයට ක්‍රියා කිරීමට යමෙකු දිරිමත් කිරීම, දේශපාලන අනුබැදිය හෝ පෙළපත ඇතුළුව, පුද්ගලයෙකුගේ සැබෑ හෝ හඳුනාගත් ආරක්ෂිත ලක්ෂණ හේතුවෙන් ඔහුට එරෙහිව ප්‍රචණ්ඩත්වය වෙනුවෙන් පෙනී සිටීම.

# කැලිෆෝනියානු නීතියඔබව ද්වේෂ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කරයි

Civil Rights Department
STATE OF CALIFORNIA

## තත්ත්ව පත්‍රිකාව

## ලබා ගත හැකි පිළියම්

රැල්ෆ් පනත මඟින් ප්‍රචණ්ඩකාරී ක්‍රියා හෝ ප්‍රචණ්ඩත්වයේ තර්ජන සඳහා ඉලක්ක කර තිබෙන පුද්ගලයන් සඳහා සිවිල් පිළියම් සපයනු ලබනුයේ ඔවුන්ගේ සැබෑ හෝ හඳුනාගත් ආරක්ෂිත ලක්ෂණ නිසාය. වෛරය සඳහා ඉලක්ක කරගත් යමෙකුට පක්ෂව අධිකරණය තීන්දු ලබා දෙන්නේ නම්, ලබා ගත හැකි පිළියම්වලට ඇතුළත් වනුයේ:

- **තහනම් නියෝග:** තහනම් නියෝග යනු යමෙකු ශාරීරිකව හෝ ලිංගිකව අපයෝජනයට ලක්වීමෙන්, තර්ජනයට ලක්වීමෙන්, ලුහුබැඳීමෙන් හෝ හිරිහැර කිරීමෙන් ආරක්ෂා කළ හැකි අධිකරණ නියෝග වේ. තහනම් නියෝග සඳහා උදාහරණ වශයෙන් පුද්ගලයෙකුට තවත් පුද්ගලයෙකුට එරෙහිව නිශ්චිත ක්‍රියාවන් සිදු කිරීම තහනම් කිරීම හෝ පුද්ගලයෙකු තවත් අයෙකුගෙන් යම් දුරක් තබා රැඳී සිටීමට නියම කිරීම. ඇතැම් විට තහනම් නියෝගයන්ට පුද්ගලයෙකුට අමතරව පවුලේ හෝ ගෘහ සාමාජිකයන් ආරක්ෂා කළ හැකිය. අධිකරණයක් මඟින් තහනම් නියෝගයක් ලබා ගැනීමෙන් අනතුරුව, එකී නියෝගය උල්ලංඝනය කරන්නවුන්ට දඩ ගැසීම හෝ අත්අඩංගුවට ගැනීම සිදුකළ හැකිය
- **තත්‍ය හානි:** වෛද්‍ය ප්‍රතිකාරවල වියදම, නැතිවූ වැටුප්, දේපල අලුත්වැඩියාව, හෝ චිත්තවේගීය දුක් වේදනා සහ පීඩාවන් සඳහා ගෙවීම වැනි ඔබ විඳ ඇති හානි ආවරණය කිරීම සඳහා මුදල්;
- **දණ්ඩනීය හානි:** ක්‍රියාව උල්ලංඝණය කරන පුද්ගලයින්ට දඬුවම් කිරීම සඳහා අධිකරණයකින් නියෝග කරන ලද අතිරේක මුදල් හානි;
- **සිවිල් දණ්ඩන:** වෛරී ක්‍රියාව අත්විඳි පුද්ගලයා විසින් ගෙන එන ඕනෑම නීතිමය ක්‍රියාමාර්ගයක දී - හෝ නීතිපතිවරයා, දිස්ත්‍රික් නීතීඥවරයෙකු හෝ නගර නීතීඥවරයෙකු මඟින්, අධිකරණය ඩොලර් 25,000 ක දඩයක් නියම කළ හැකි අතර, එය පැමිණිල්ල ගොනු කරන පුද්ගලයා වෙත ලැබෙනු ඇත; සහ/හෝ
- **නීතිඥ ගාස්තු:** නඩුවේ ප්‍රතිඵලයක් ලෙස නීතිඥ ගාස්තු ගෙවීමට උසාවියකට නියෝග කළ හැකිය - වෛරය සඳහා ඉලක්ක කරගත් පුද්ගලයෙකු ප්‍රචණ්ඩකාරී ක්‍රියාව සිදු කළ පුද්ගලයාගේ නීතිඥ ගාස්තුවලට කිසිවිටෙක වගකිව යුතු නොවේ.

## යමෙක් මට එරෙහිව වෛරී ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක් සිදු කළහොත් මා හට කුමක් කළ හැකිද?

1. පළමුව, ඔබට සුරක්ෂිත යැයි හැඟෙන ස්ථානයකට යන්න. අවශ්‍ය නම් වෛද්‍ය උපකාර ලබාගන්න.
2. 1-833-8-NO-HATE (1-833-866-4283) හිදී California vs. Hate Resource Line and Network (CA vs. Hate) සම්බන්ධ කරගන්න නැතිනම් https://stophate.calcivilrights.ca.gov/s/ ඔස්සේ සංස්කෘතික වශයෙන් සුදුසුකම් ලත් සම්පත් සහ සහාය සඳහා ප්‍රවේශය ලබා ගැනීමට මාර්ගගතව වාර්තා කරන්න. CA vs. Hate නීතිය බලාත්මක කිරීමේ වාර්තාකරණ මාර්ගයක් නොවේ; අමතන පුද්ගලයන්ට ඊළඟ පියවර සඳහා ඔවුන්ගේ විවිධ විකල්පයන පිළිබඳව ඉගෙන ගත හැකිය. මානසික සෞඛ්‍ය හෝ අනෙකුත් සමාජ සේවා සහාය ඇතුළුව සංස්කෘතික වශයෙන් සුදුසුකම් ලත් ප්‍රජා-පාදක සංවිධානවලට පිරිනැමිය හැකි සම්පත් සමඟ සම්බන්ධ වීම මෙයට ඇතුළත් විය හැකිය. පුද්ගලයන්ට සහ ප්‍රජාවන්ට මීළඟ පියවර සඳහා විකල්පයන් පිළිබඳව අපගේ කාර්ය මණ්ඩලයෙන් පසු විපරම් ලබා ගැනීම සඳහා තෝරීම් කළ හැකිය. ඉල්ලා සිටින්නේ නම්, CA vs. Hate හට නීතිය බලාත්මක කිරීම සම්බන්ධ කර ගැනීම සහ මෙම සිද්ධීන් සම්බන්ධයෙන් අපරාධ විමර්ශනයක් සිදු වන සාමාන්‍ය ක්‍රම පිළිබඳව අමතර තොරතුරු සැපයිය හැකිය. CA vs. Hate දුරකථන අංකයක් සහ සබැඳි ද්වාරයක් හරහා සියලුම ප්‍රජාවන් සඳහා භාෂා සහාය ලබා දෙයි.
3. ඔබට සුවපහසුවක් දැනෙන්නේ නම්, ඔබට ඕනෑම ප්‍රචණ්ඩකාරී තර්ජනයක් හෝ ක්‍රියාවක් ඔබේ ප්‍රාදේශීය පොලිස් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ හැකිය. ප්‍රචණ්ඩත්වය හෝ ප්‍රචණ්ඩත්වයේ තර්ජනය සහ නීතිය යටතේ ආරක්ෂිත ඔබේ සැබෑ හෝ හඳුනාගත් ලක්ෂණය අතර සම්බන්ධය පැහැදිලි කිරීමට උත්සාහ කරන්න (ජාතිය, වර්ණය, මුල් ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවයේ අනන්‍යතාවය, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ආබාධිකත්වය, ලිංගික දිශානතිය, ආගම, ආදිය). චෝදනා ලද ක්‍රියාව විමර්ශනය කිරීමෙන් පසුව, අභිචෝදකයාට සිවිල් හෝ අපරාධ නඩුවක් ඉදිරිපත් කළ හැකිය.

# කැලිෆෝනියානු නීතියඹබව ද්වේෂ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කරයි

## තත්ත්ව පත්‍රිකාව

Civil Rights Department
STATE OF CALIFORNIA

4. අපරාධකරු(වන්) පිළිබඳව තොරතුරු; පැවසූ /කළ නිවැරදි වචන හෝ අභිනයන් (ඇත්නම්); සියලුම සාක්ෂි සුරකින්න හෝ ලේඛනගත කරන්න (උදාහරණයක් වශයෙන්, පළුදු කිරීම්, බිත්තර කටු, ඔබේ වාහනයේ හෝ නිවසක ලිවීමක්, අසල ඇති ව්‍යාපාරයකින් හෝ නිවසකින් ලත් වීඩියෝ දර්ශන) ඇතුළුව සිද්ධිය පිළිබඳව ඔබට හැකි තරම් කරුණු සටහන් කරගැනීමට උත්සාහ කරන්න; වෛරය සහ සාක්ෂි ඉලක්ක කරගත් වෙනත් පුද්ගලයින්ගේ නම්, ලිපිනයන්, දුරකථන අංක සහ ඊමේල් ලබා ගන්න. සිද්ධියෙන් පසුව මෙම තොරතුරු රැස්කර ගැනීමට ඔබට වෙනත් අයගෙන් උපකාර ඉල්ලා සිටිය හැකිය.

5. ඔබට CRD වෙත පැමිණිල්ලක් ගොනු කළ හැකිය. CRD මඟින් හිමිකම් විමර්ශනය කර මැදිහත්වීම් සහ බේරුම්කරණයට පහසුකම් සලසනු ඇත - සහ ඇතැම් නඩුවලදී - ඔබට කිසිදු වියදමක් නොමැතිව පැමිණිල්ල අධිකරණයේ අභිචෝදනා කළ හැකිය. CRD වෙත හිමිකම් පෑම වාර්තා කිරීම සඳහා ඔබට නීතිඥයෙකු අවශ්‍ය නොවන නමුත් ඔබ එසේ තෝරා ගන්නේ නම් ඔබට එක් අයෙක් සම්බන්ධ කර ගත හැකිය. වෙනත් රාජ්‍ය ආයතනවලටද පැමිණිලි භාරගත හැකිය.

6. රැල්ෆ් පනත බලාත්මක කිරීම සඳහා ඔබට නීතිඥයෙකු සමඟ කතිකා කර කැලිෆෝනියානු සිවිල් සංග්‍රහයේ 52 වන වගන්තිය යටතේ පෞද්ගලික නඩුවක් ගොනු කළ හැකිය. ඔබේ ප්‍රාන්ත හෝ ෆෙඩරල් ව්‍යවස්ථාපිත හෝ ව්‍යවස්ථානුකූල අයිතිවාසිකම් සමඟ ප්‍රචණ්ඩත්වය හෝ ප්‍රචණ්ඩත්වයේ තර්ජනය මඟින් කිසිවෙකු මැදිහත් වීම තහනම් කෙරෙන, කැලිෆෝනියානු සිවිල් සංග්‍රහයේ 52.1 වන වගන්තිය, බේන් සිවිල් අයිතිවාසිකම් පනත යටතේ ඔබට හිමිකම් පෑමක් ද සිදු කළ හැකිය. බේන් පනත යටතේ ඔබේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇතැයි ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබට සිවිල් පිළියම් අනුගමනය කළ හැකිය, නැතහොත් රජයේ අභිචෝදකයෙකු හට සිවිල් සහ අපරාධ දඬුවම් යන දෙකම අනුගමනය කළ හැකිය.

7. ඔබේ වෛද්‍ය වියදම්, ආදායම් අලාභය සහ වෙනත් අලාභ ආවරණය කිරීම සඳහා ප්‍රතිපූරණය ඇතුළුව, ඔබේ අලාභ සඳහා වන්දි ලබා ගැනීමට ඔබට කැලිෆෝනියානු වින්දිත වන්දි මණ්ඩලයට (CalVCB) අයදුම් කළ හැකිය. CalVCB සමඟ සෘජුව ක්‍රියා කරන ඔබේ ප්‍රාදේශීය දිස්ත්‍රික් නීතිඥ කාර්යාලයේ වින්දිත සාක්ෂිකරුවන්ගේ සහායක මධ්‍යස්ථානයෙන් ඔබට CalVCB වෙත අයදුම්පත් සඳහා සහාය ලබා ගත හැකිය. ඔබ ආසන්නයේ වින්දිත සාක්ෂිකරුවන්ගේ සහායක මධ්‍යස්ථාන සොයා ගැනීමට, පිවිසෙන්න: www.victims.ca.gov/for-victims/get-help/

---

**ආරක්ෂිත ලක්ෂණයක් මත පදනම් වූ වෛරී ප්‍රචණ්ඩත්වය සඳහා ඔබව ඉලක්ක කර තිබෙන බව ඔබ සිතන්නේ නම්, පැමිණිල්ලක් ගොනු කරන්න. පැමිණිල්ල සාමාන්‍යයෙන් නීති විරෝධී වෛරී සහගත ක්‍රියාවෙන් වසරක් ඇතුළත ගොනු කළ යුතු නමුත්, එම ක්‍රියාව සිදු කළ පුද්ගලයා සිද්ධිය වූ අවස්ථාවේ නොදන්නේ නම් ගොනු කිරීම සඳහා දීර්ඝ කාල සීමාවක් තිබිය හැකිය. ඔබට ගොනු කිරීමේ කාලරාමුව පිළිබඳව ප්‍රශ්න හෝ රැල්ෆ් පනත් පැමිණිල්ලක් ගොනු කිරීම පිළිබඳව වෙනත් ප්‍රශ්න ඇත්නම් කරුණාකර CRD අමතන්න.**

ඔබට සාධාරණ උපකාරය අවශ්‍ය ආබාධිතත්වයක් තිබේ නම්, CRD හට ඔබට දුරකථනයෙන් හෝ, බිහිරි හෝ ශ්‍රවණාබාධ ඇති හෝ කථන ආබාධ ඇති පුද්ගලයින් සඳහා California Relay Service (711) හරහා ඔබේ බඳවාගැනීම් සටහන් කරගැනීමෙන් ඔබට සහාය විය හැකිය, නැතහොත් පහත අයුරින් අපව සම්බන්ධ කරගන්න.

## පැමිණිල්ලක් ගොනු කිරීම සඳහා

**සිවිල් අයිතිවාසිකම් දෙපාර්තමේන්තුව**
calcivilrights.ca.gov/complaintprocess
සම්පූර්ණයෙන්ම නිදහස්: 800.884.1684
TTY: 800.700.2320

මෙම මඟ පෙන්වීමේ අමතර පරිවර්තන සඳහා, පිවිසෙන්න:

www.calcivilrights.ca.gov/posters/HateViolence